දෙවන කලාපය
ISSN - 1391-6785

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
UNITAS SALUS NOSTRA
INCORPORATED 1925

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්

## තේ තවාන් ක්‍රියාවලිය

### සුදුසු කැබලි තෝරා ගැනීම

- රිකිලි වලින් කපා ගත් කැබලි සියල්ලම, හොඳ කැබලි , මධ්‍යස්ථ කැබලි සහ දුර්වල කැබලි වශයෙන් කොටස් තුනකට බෙදා ගන්න.
  1. හොඳ කැබලි - මේවායේ අඟල් 1/2 -1 ක් පමන දිගට වැඩුන අංකුර තිබිය යුතුය.
  2. මධ්‍යස්ථ කැබලි - අඟල් 1/4 - 1/2 ක් පමන දිගට වැඩුන අංකුර තිබිය යුතුයි.
  3. දුර්වල කැබලි - අංකුර හොඳින් වර්ධනය වී නොමැති හෝ මල් පොහොට්ටු / පුෂ්ප අංකුර සහිත අතු කැබලි

### තවාන් මළුවල කැබලි සිටුවා ගැනීම

- තවාන් පාත්ති දෙපැත්තේ ඇති මළු වල සිටුවීමට මධ්‍යස්ථ කැබලි ලෙස හැඳින්වූ දෙවන වර්ගයට අයත් කැබලි යොදා ගන්න. මෙහිදී මෙම කැබලි දෙක බැගින් සිටුවන්න. ඉතිරියක් ඇත්නම් වෙනම සිටුවා පසුව පාවිච්චියට තබා ගන්න.
- හැකි සෑම විට පළමු (01) වර්ගයට අයත් කැබලි සිටුවිය යුතුයි. මෙවැනි හොඳ කැබලි වැඩිම ප්‍රමාණයක් ලබාගැනීමට පහත ක්‍රම අනුගමනය කරන්න.
- මව් ශාක වලින් රිකිලි ලබාගැනීමට දින 5-10 කට පෙර එම රිකිලි වල මුදුනේ අංකුරය කඩා ඉවත් කරන්න.
- මව් ශාක වලින් අතු කැපීමේදී හොඳ අතු රිකිලි පමණක් තෝරාගන්න.
- මීට අමතරව වෙනත් ප්‍රදේශයක සිට ප්‍රවාහනය කර රැගෙන ආ අතු රිකිලි ඇත්නම් එම රිකිලි පැය කිහිපයක් හෝ එක් රැයක් ජලය භාජනයක තිබෙන්නට හැර කැබලි ලබා ගන්න.

### තවාන් මළුවල කැබලි සිටුවීම හා පාළු සිටුවීම

- කැබලි සිටුවා සති 6 ක් පමණ යන තුරු මැරී ගිය කැබලි හෝ දුර්වල කැබලි ඉවත් කර පාළු සිටුවීම කල යුතුයි. (කැබලි සිටුවීම ආරම්භ කර සති 6 ක් පමන ගත වූ පසු තවාන් පාත්ති වල තිබිය යුත්තේ හොඳ කැබලි පමණි.)

### පොහොර යෙදීම

- ඔබ සිටවූ කැබලි වල මුල් ඇදීමෙන් පසු පමණක් පොහොර යෙදීම සිදු කරන්න.
  (මේ සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ තේ පොහොර නිර්දේශයන් අනුගමනය කල යුතුයි)
  එමෙන්ම පොහොර යෙදීම සිදු කරන කාලය වන විට තවාන් මළු වල කැබලි දෙකක් නොතිබිය යුතුය.

### තවාන් පැල වල වංගි අංකුරය ඉවත් කිරීම (DISBUDDING)

- තවාන් පැල වල පත්‍ර 4-5 ක් ඇති විට අංකුර ඉවත් කල යුතුයි. පත්‍ර 2-4ක් ඇති එහෙත් පත්‍ර මෝරා ඇති පැල වලද අංකුරය ඉවත් කිරීම සිදු කල හැක.

### තවාන් පැල වල අග දල්ල කැඩීම (THUMB - NAILING)

- පත්‍ර 7-8ක් ඇති අවස්ථාව මේ සඳහා වඩාත් සුදුසුය. නමුත් පැති අතු නොවැඩී, එක් අත්තක් පමණක් ඉහලට වැඩී ඇත්නම් පමණක් අග දල්ල කඩා දමන්න.

### තවාන් පැල වර්ග කර තැන්පත් කිරීම (RE STACKING)

- තවාන් පැලවල මුල් වර්ධනය සඳහාත් පසතුල වාතාශ්‍රය දියුණු කිරීම සහ අතු විහිදීම දියුණු කිරීම සඳහාත් මෙම ක්‍රියාව ඉතා වැදගත් වේ. වඩා හොඳ ප්‍රතිඵල සඳහා තවාන් පාත්තිය මැද තිබූ පැල තවාන අයිනටත් අයිනේ තිබෙන පැල තවාන මැදටත් තබන්න. මෙම ක්‍රියාවලිය දෙවරක් - තුන්වරක් කිරීමෙන් උපරිම ප්‍රතිඵල ලබාගත හැක.

### සෙවන අඩු කිරීම / පැල දැඩි කිරීම

- තවාන් පැල වලට මාස 5 - 7 ක් වන විට සපයා ඇති සෙවන ක්‍රමයෙන් ඉවත් කරන්න.

එස්. විමලධර්ම